කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021**

**2024 සැප්තැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

**සංවර්ධන අධ්‍යයන**

**(පැරණි නිර්දේශය - අධ්‍යයන වර්ෂ 2012/13 සිට 2016 දක්වා)**

**සංවර්ධන භාවිතයන් සඳහා පර්යේෂණ ක්‍රමවේද DVST– E3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) 'පර්යේෂණ' නිර්වචනය කරන්න. (ලකුණු 05)

ආ) නිවැරදිව සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට පර්යේෂණවලින් ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 15)

02. සංවර්ධන ක්‍රියාවලියට අදාළ පර්යේෂණයක් සඳහා සාහිත්‍ය විමර්ශනයක අවශ්‍යතාව සහ එහි වැදගත්කම උචිත නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

03. අ) පර්යේෂණ ගැටලුව හඳුනාගැනීම සඳහා භාවිතකරන මූලාශ්‍ර 2 ක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

ආ) ඔබ දැක්වූ මූලාශ්‍ර අතුරින් එක් මූලාශ්‍රයක් ආශ්‍රයෙන් පර්යේෂණ ගැටලුවක් ගොඩනගන අයුරු උදාහරණ සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 16)

04. සංවර්ධන ව්‍යාපෘතියක් මගින් ඇතිවිය හැකි පාරිසරික බලපෑම හඳුනාගැනීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුකරණය (EIA) සිදුකරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. අ) සසම්භාවී නියැදුම් ක්‍රම කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

ආ) ඔබ විසින් දැක්වූ එම නියැදුම් ක්‍රම භාවිතයෙන් සිදුකල හැකි පර්යේෂණ පිළිබඳව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

06. ගුණාත්මක පර්යේෂණයකට අදාළව දත්ත රැස්කිරීම සඳහා යොදාගත හැකි ක්‍රමවේදයක් දක්වා, එම ක්‍රමවේදය යොදාගැනීමේ උචිතභාවය පරීක්ෂා කරන්න. (ලකුණු 20)

07. ඔබ විසින් තෝරාගනු ලබන පර්යේෂණ ගැටලුවකට අදාළව පර්යේෂණ යෝජනාවලියක් පිළියෙළ කරන අයුරු නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

08. පහත මාතෘකා අතුරින් දෙකකට (02) කෙටි සටහන් සපයන්න.

අ) ව්‍යවහාරික පර්යේෂණ (Applied Research)

ආ) පර්යේෂණ පරතරය (Research Gap)

ඇ) ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමය (Structured Questionnaire)

ඈ) පංගු/ කොටස් නියැදීම (Quota Sampling) (ලකුණු 10x2=20)

************************************